නායයෑම් ආපදා වැළැක්වීමේ ව්‍යාපෘතිය - 2022
------------------------------------------------

නායයෑම් ආපදා වැලැක්වීමේ ව්‍යාපෘතියේ 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය සහ ජපාන ජාත්‍යන්තර සහයෝගිතා නියෝජිතායතනය අතර 2013 මාර්තු 14 දින එළඹි සංදේශයේ 14 වගන්තියෙහි සඳහන් විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

**1.2** ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය

ව්‍යාපෘතියේ ණය ගිවිසුමට අනුව, එවකට මහාමාර්ග, වරාය සහ නාවික අමාත්‍යාංශය, වර්තමානයේ ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර මාර්ග සංවර්ධන අධිකාරිය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. මධ්‍යම, ඌව සහ සබරගමුව පළාත්වල උස් බිම් ප්‍රදේශ වල සුදුසු ප්‍රතික්‍රියාකාරකම් ක්‍රියාත්මක කරමින් මූලික යටිතල පහසුකම් ලෙස ජාතික මාර්ග ඉලක්ක කර ගනිමින් නායයෑමේ ව්‍යසනයන් අවම කිරීම, එමඟින් ආර්ථික හා සමාජීය සංවර්ධනයට දායක වීම සහ මාර්ග පද්ධතියේ ආරක්ෂාව ඉහළ නැංවීම සහ මාර්ග ජාලයේ ආරක්ෂාව වැඩි කිරීම සහ මාර්ග භාවිතා කරන්නන් සහ පදිංචිකරුවන් ඇතුළු ජනතාවගේ ජීවිත සුරක්ෂිත කිරීම ව්‍යාපෘතියේ අරමුණ වේ. ව්‍යාපෘතියේ ක්‍රියාකාරකම් පැකේජය 01 සහ පැකේජය 02 යන කොටස් දෙකක් යටතේ ක්‍රියාත්මක වේ. ණය ගිවිසුමට අනුව, ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු. මිලියන 16,201.2 කට සමාන එ.ජ.ඩො. මිලියන 122.6 ක් වන අතර එයින් රු. මිලියන 12,870.45 කට සමාන එ.ජ.ඩො. මිලියන 97.4 ක් ජපාන ජාත්‍යන්තර සහයෝගිතා නියෝජිතායතනය විසින් මූල්‍යකරණය කිරීමට එකඟ විය. ඉතිරි මුදල වූ රු. මිලියන 3,331 ක් ශ්‍රී ලංකා රජය විසින් මූල්‍යකරණය කිරීමට බලාපොරොත්තු වේ. ව්‍යාපෘතිය එහි කටයුතු 2013 ජූලි 05 දින ආරම්භ කල අතර මූලිකව 2020 ජූලි 05 දින වනවිට අවසන් කිරීමට නියමිතව තිබුණි. කෙසේ වෙතත්, ව්‍යාපෘතියේ කටයුතු අවසන් කිරීමේ දිනය තවත් වසර දෙකකින් දීර්ඝ කර තිබුණි.

**1.3** තත්ත්වාගණනය කළ මතය.

මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය යන කොටස් විස්තර කර ඇති කරුණුවල බලපෑම හැර 2022 දෙසැම්බර් 31 දිනට නායයෑම් ආපදා වැලැක්වීමේ ව්‍යාපෘතියේ මූල්‍ය තත්ත්වය හා එහි මුදල් ප්‍රවාහය ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.4** තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණනය ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැලසීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.5** මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාර්ශවයන්ගේ වගකීම්.

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ව්‍යාපෘතියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය පරීක්ෂා කිරීම සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

**1.6 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම.**

**සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.**

**ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,**

- **ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් , චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.**

- **අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.**

- **භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ,ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.**

- **මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.**

**මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දූර්වලතා හා අනෙකුත් කරුනු පිලිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදී.**

**2. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් අදහස් දැක්වීම.**

**2.1 ගිණුම්කරණ අඩුපාඩු.**

| ගිණුම්කරණ නිරීක්ෂණය | අඩුපාඩු/විගණන | වටිනාකම (රු.මිලියන) | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණනකගේ නිර්දේශය |
|---|---|---|---|---|

| | | | |
|---|---|---|---|
| ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිය 05 හි 43(අ) වගන්තියට අනුව, එක් එක් මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයේ මූල්‍ය වත්කම් සහ වගකීම් මූල්‍ය තත්ත්වය ප්‍රකාශ කරන දිනයේ අවසන් විදේශ විනිමය අනුපාතයට පරිවර්තනය කළ යුතුය. කෙසේ වෙතත්, ව්‍යාපෘතියේ ණය ශේෂයට අදාළ රු. මිලියන 7,522 ක විදේශ ණය සම්බන්ධ විනිමය ගැලපීම ගිණුම්ගත කර නොතිබුණි. | 7,522 | වි.ස.දෙ. වාර්තා අනුව සත්‍ය විදේශ විනිමය නිදහස් කළ ප්‍රමාණය සලකා බැලූ අතර ඒ අනුව විනිමය වෙනස්කම් ගණනය කරන ලදී. ඒ අනුව, නිශ්චිත මුදල අපගේ මූල්‍ය ප්‍රකාශනවල දැක්වේ. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතියට අනුගත විය යුතුය. |

2.2 නීති, රීති සහ රෙගුලාසි වලට අනුකූල නොවීම

| නීති, රීති සහ රෙගුලාසි වලට යොමුව | අනුකූල නොවීම/විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශ |
|---|---|---|---|
| 2019 මාර්තු 15 දිනැති අංක. 01/2019 දරන කළමනාකරණ චක්‍රලේඛයේ 9.3 උප වගන්තිය. | සමාලෝචිත වර්ෂය තුළ මෙහෙයුම් කමිටු රැස්වීම් පවත්වා නොතිබුණි. | ප්‍රගති සමාලෝචන රැස්වීම් අවශ්‍ය විටදී Zoom තාක්ෂණය මගින් පවත්වන ලදී. | කළමනාකරණ චක්‍රලේඛ උපදෙස් වලට අනුකූලව කටයුතු කළ යුතුය. |

3. භෞතික කාර්ය සාධනය

3.1 කොන්ත්‍රාත් පරිපාලනය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශ |
|---|---|---|
| දේශීය කොන්ත්‍රාත්කරුවන්ගේ පළපුරුද්ද නොමැතිකම, ආරක්ෂක පියවර පිළිබඳ අවබෝධයක් නොමැතිකම සහ නායයෑම් ඇතිවීම වැළැක්වීමේ ක්‍රියාමාර්ග වැඩි කිරීම හේතුවෙන් මෙම ව්‍යාපෘතියේ “ඒ” සහ “බී” අක්ෂර යටතේ ඉදිකිරීම් අවසන් කිරීම වසර දෙකකට වැඩි කාලයකින් ප්‍රමාද වී තිබුණි. එබැවින්, ණය කාලය තුළ ව්‍යාපෘතිය සඳහා ජපන් යෙන් මි. 7,619 ක මුළු ණය මුදලින් ජපන් යෙන් මි. 6,283 ක් පමණක් භාවිතා කර තිබුණි. එබැවින්, ණය කාලය අවසන් වන විට භාවිතයට නොගත් ණය ශේෂය සඳහා ගෙවන ලද කැපකිරීමේ ගාස්තුව ආර්ථික නොවන බව නිරීක්ෂණය විය. | මෙම ව්‍යාපෘතියේ විෂය පථය වූයේ අක්ෂර “ඒ” සහ අක්ෂර “බී” යටතේ නාය ගිය ස්ථාන 16 කි. නාය ගිය ස්ථාන 16 නිම කිරීමට අමතරව, යෙන් මි. 1000 කට වඩා ඉතිරි කර ගනිමින් ණය මුදල මගින් අමතර නාය ගිය ස්ථාන 07 ක් කාල රාමුව තුළ නිම කරන ලදී. | ණය මුදල ඵලදායී ලෙස භාවිතා කළ යුතුය. |

3.2 ඌන උපයෝජිත සම්පත්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශ |
|---|---|---|

මෙම ව්‍යාපෘතිය යටතේ රු. මිලියන 30 ක් වැයකර නායයෑම් දැනුම්දීම කල්තියා හඳුනාගැනීම සඳහා පූර්ව අනතුරු ඇඟවීමේ පද්ධතියක් (EWS) ස්ථාපිත කර තිබුණි. කෙසේ වෙතත්, සමාලෝචිත වර්ෂය අවසානය වනවිටත් මාර්ග සංවර්ධන අධිකාරිය විසින් එම පද්ධතිය භාවිතා කර නොතිබුණි. එබැවින් මෙම පද්ධතිය සඳහා දරන ලද වියදම අනාර්ථික තත්ත්වයට පත්ව තිබුණි.

ණය ගිවිසුමට අනුව, මෙම ව්‍යාපෘතියේ ව්‍යාපෘති කළමනාකරණ ඒකකය ජා.ගො.ප.සං. සහ මා.සං.අ. සමඟ එක්ව ස්ථාපිත කළ යුතුව තිබුණි. එබැවින්, පූර්ව අනතුරු ඇඟවීමේ පද්ධතිය ඵලදායී ලෙස ක්‍රියාත්මක වන අතර ණය ගිවිසුමට අනුව ජා.ගො.ප.සං. විසින් භාවිතා කරන බැවින් ජා.ගො.ප.සං. විසින් උපරිම ප්‍රතිලාභ ලබා ගනී.

ව්‍යාපෘතියේ අරමුණ සඳහා පූර්ව අනතුරු ඇඟවීමේ පද්ධතිය (EWS) භාවිතා කිරීමට කටයුතු කළ යුතුය.